④ ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1808/11 — 2013 අප්‍රේල් මස 30 වැනි අඟහරුවාදා - 2013.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1991 අංක 7 දරන බස්නාහිර පළාතේ මෝටර් ප්‍රවාහන ප්‍රඥප්තිය පිළිබඳ නියෝග

1991 අංක 7 දරන බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තියේ 129(1) වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග.

හේවා මාතරගේ උපාලි කොඩිකාර,
ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු,
සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා
බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

2013 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ දී ය.

*නියෝග*

මෙම නියෝග 2013 මෝටර් වාහන ගාස්තු පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම නියෝග 2013 මැයි මස 02 වැනි දින සිට ක්‍රියාත්මක වන්නේය.

මෙහි පහත අර්ථ නිරූපනය කොට, වර්ග කොට ඇත්තා වූ වාහන සඳහා 2013.05.02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවිය යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තුව පහත දැක්වේ.

(අ) *අර්ථ නිරූපනය*

කාරයක්, ගිලන් රථයක්, අවමංගල රථයක්, ජීප් රථයක් හෝ අනෙකුත් පුද්ගලික මගී වාහනයක් යන්නෙන් "පුද්ගලයින් නව දෙනෙකුට (රියදුරු ඇතුළුව) නොවැඩි සංඛ්‍යාවක්" සහ ඔවුන්ගේ බඩු බාහිරාදිය ප්‍රවාහනය.

1A - PG 001617— 735 (2013/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *වාහන පන්තිය* | | *හිස්ව ඇතිවිට බර* | *පාවිච්චි කරනු ලබන ඉන්ධන වර්ගය* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|---|---|
| කාරය, ගිලන් රථය, අවමංගල රථය ජීප් රථය හෝ අනෙක් පෞද්ගලික මගී වාහන | (1) | කි.ග්‍රෑ. 762 (හො.15) දක්වා | පෙට්‍රල් | 2000.00 |
| | | එම | ඩීසල් | 3100.00 |
| | (2) | කි.ග්‍රෑ. 762 (හො. 15) ට වැඩි එහෙත් කි.ග්‍රෑ 1016 (හො.20) පමණක් දක්වා | පෙට්‍රල් | 2200.00 |
| | | එම | ඩීසල් | 4000.00 |
| | (3) | කි. ග්‍රෑ. 1016 (හො.20) ට වැඩි එහෙත් කි.ග්‍රෑ. 1270 (හො.25) පමණක් දක්වා | පෙට්‍රල් | 3000.00 |
| | | එම | ඩීසල් | 6000.00 |
| | (4) | කි.ග්‍රෑ. 1270 (හො.25) ට වැඩි | පෙට්‍රල් | 4000.00 |
| | | එම | ඩීසල් | 8000.00 |

(ආ) *අර්ථ නිරූපනය :*

(1) *ලොරිය.* - ලොරි යන්නෙන් සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් බඩු ප්‍රවාහනය කිරීම සඳහා තනනු ලැබූ හෝ සකස් කරනු ලැබූ මෝටර් වාහනයක් අදහස් වේ. ඊට එසේ තනනු ලැබූ හෝ සකස් කරනු ලැබූ ට්‍රේලරයක් ද ඇතුළත් වේ.

(2) *වාහනයේ දළ බර.* - වාහනයේ දළ බර යන්නෙන්, මගීන් සහ භාණ්ඩ යන දෙකම ඇතුළුව, වාහනයේ රැගෙන යා හැකි බර ප්‍රමාණයට එකතු කරන ලද, වාහනය හිස්ව ඇති විට බර අදහස් වේ.

| *වාහන පන්තිය* | | *වාහනයේ දළ බර* | *පාවිච්චි කරනු ලබන ඉන්ධන වර්ගය* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|---|---|
| ලොරිය සහ විශේෂ කාර්ය වාහන | (1) | කි.ග්‍රෑ.2,000 (හො.40) දක්වා | පෙට්‍රල් | 1500.00 |
| | | එම | ඩීසල් | 3000.00 |
| | (2) | කි.ග්‍රෑ.2,000 (හො.40) ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 5,000 (හො.100) පමණක් දක්වා | පෙට්‍රල් | 2000.00 |
| | | එම | ඩීසල් | 4000.00 |
| | (3) | කි.ග්‍රෑ.5,000 (හො.100) ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 10,000 (හො.200) පමණක් දක්වා | පෙට්‍රල් | 2500.00 |
| | | එම | ඩීසල් | 6000.00 |
| | (4) | කි.ග්‍රෑ. 10,000 (හො.200) ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 15,000 (හො.300) පමණක් දක්වා | පෙට්‍රල් | 3000.00 |
| | | එම | ඩීසල් | 7000.00 |
| | (5) | කි.ග්‍රෑ. 15,000 (හො.300) ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 20,000 (හො.400) පමණක් දක්වා | පෙට්‍රල් | 4500.00 |
| | | එම | ඩීසල් | 10,000.00 |

| *වාහන පන්තිය* | *හිස්ව ඇතිවිට බර* | *පාවිච්චි කරනු ලබන ඉන්ධන වර්ගය* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|---|
| | (6) කි.ග්‍රෑ. 20,000 (හො.400) ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 25,000 (හො.500) පමණක් දක්වා | පෙට්‍රල් | 4600.00 |
| | එම | ඩීසල් | 12,000.00 |
| | (7) කි.ග්‍රෑ. 25,000 (හො.500) ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 30,000 (හො.600) පමණක් දක්වා | පෙට්‍රල් | 6000.00 |
| | එම | ඩීසල් | 14,000.00 |
| | (8) කි.ග්‍රෑ. 30,000 (හො.600) ට වැඩි | පෙට්‍රල් | 7000.00 |
| | එම | ඩීසල් | 15,000.00 |
| ලොරි ට්‍රේලරය | | | |
| | (1) කි. ග්‍රෑ. 751 සිට කි. ග්‍රෑ. 2,000 දක්වා | | 3,000.00 |
| | (2) කි. ග්‍රෑ. 2000ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 5000ට අඩු | | 4,000.00 |
| | (3) කි. ග්‍රෑ. 5000ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 10000ට අඩු | | 6,000.00 |
| | (4) කි. ග්‍රෑ. 10000ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 15000ට අඩු | | 7,000.00 |
| | (5) කි. ග්‍රෑ. 15000ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 20000ට අඩු | | 10,000.00 |
| | (6) කි. ග්‍රෑ. 20000ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 25000ට අඩු | | 12,000.00 |
| | (7) කි. ග්‍රෑ. 25000ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 30000ට අඩු | | 14,000.00 |
| | (8) කි. ග්‍රෑ. 30000ක් හෝ ඊට වැඩි | | 15,000.00 |

(ඇ) *අර්ථ නිරූපනය*

*ද්විකාර්ය වාහනය.* - ද්විකාර්ය වාහනය යන්නෙන්, පුද්ගලයන් සහ භාණ්ඩ යන දෙකම එකවර ප්‍රවාහනය කිරීම සඳහා සැළසුම් කොට තනනු ලැබ ඇති වාහනයක් අදහස් වේ. එසේ වුවත්, එහි ප්‍රවාහනය කළ යුතු පුද්ගලයන් සංඛ්‍යාව පෞද්ගලික මගී වාහනයක රැගෙන යාමට අවසර දී ඇති සංඛ්‍යාව (නවය) නොඉක්මවිය යුතුය.

| *වාහන පන්තිය* | *වාහනයේ දළ බර* | *පාවිච්චි කරනු ලබන ඉන්ධන වර්ගය* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|---|
| ද්විකාර්ය වාහනය | (1) කි.ග්‍රෑ. 1,000 (හො.20) දක්වා | පෙට්‍රල් | 2,000.00 |
| | එම | ඩීසල් | 3,500.00 |
| | (2) කි.ග්‍රෑ. 1,000 (හො.20) ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 1,500 (හො.30) පමණක් දක්වා | පෙට්‍රල් | 2,200.00 |
| | එම | ඩීසල් | 4,000.00 |
| | (3) කි.ග්‍රෑ. 1,500 (හො.30) ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 2,000 (හො.40) පමණක් දක්වා | පෙට්‍රල් | 2,700.00 |
| | එම | ඩීසල් | 4,200.00 |
| | (4) කි.ග්‍රෑ. 2,000 (හො.40) ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 2,500 (හො.50) පමණක් දක්වා | පෙට්‍රල් | 3,100.00 |
| | එම | ඩීසල් | 5,500.00 |
| | (5) කි.ග්‍රෑ. 2,500 (හො.50) ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 3,000 (හො.60) පමණක් දක්වා | පෙට්‍රල් | 4,200.00 |
| | එම | ඩීසල් | 9,000.00 |

| වාහන පන්තිය | හිස්ව ඇතිවිට බර | පාවිච්චි කරනු ලබන ඉන්ධන වර්ගය | ගාස්තුව රු. ශත |
|---|---|---|---|
| | (6) කි.ග්‍රෑ. 3,000 (හො.60) ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 3,500 (හො.70) පමණක් දක්වා | පෙට්‍රල් | 5,000.00 |
| | එම | ඩීසල් | 10,000.00 |
| | (7) කි.ග්‍රෑ. 3,500 (හො.70) ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 4,000 (හො.80) පමණක් දක්වා | පෙට්‍රල් | 6,000.00 |
| | එම | ඩීසල් | 12,000.00 |
| | (8) කි.ග්‍රෑ. 4,000 (හො.80) ට වැඩි | පෙට්‍රල් | 7,000.00 |
| | එම | ඩීසල් | 15,000.00 |

(ඈ) අර්ථ නිරූපනය

1. මගීන් ප්‍රවාහනය සඳහා යොදා ගනු ලබන වාහන - මගීන් ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගනු ලබන බස් රථයක් හෝ මෝටර් කෝච් රථයක් හෝ මෝටර් වැගන් රථයක් මේවාට අයත් වේ.
2. "මෝටර් කෝච් රථයක්" යන්නෙන්, පුද්ගලයින් නව දෙනෙකුට (රියදුරු ඇතුළුව) වැඩි සංඛ්‍යාවක් සහ ඔවුන්ගේ බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීම සඳහා තනනු ලැබූ මෝටර් වාහනයක් අදහස් වේ.
3. "බස් රථයක්" යන්නෙන්, බස් රථයක් (ඔම්නි බස්) වශයෙන් ලියාපදිංචි කර ඇති මෝටර් කෝච් රථයක් අදහස් වේ.
4. "මෝටර් වැගන් රථයක්" යන්නෙන්, පුද්ගලයන් නව දෙනෙකුට (රියදුරු ඇතුළුව) නොඅඩු සංඛ්‍යාවක් රැගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ තනනු ලැබූ හෝ සකස් කරනු ලැබූ වාහනයක් අදහස් වේ.
5. "පෞද්ගලික කෝච් රථ" යන්නෙන්, පෞද්ගලික කෝච් රථයක් වශයෙන් ලියාපදිංචි වී ඇති මෝටර් කෝච් රථයක් අදහස් වේ.

| | වාහන පන්තිය | මගී ආසනයක් සඳහා ගාස්තුව රු. ශත |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ / හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයට හැර නිත්‍ය වශයෙන් මගී ප්‍රවාහනය සඳහා යොදවා ඇති බස් රථ | 150.00 |
| (ආ) | මෝටර් වැගන් රථ | 150.00 |
| (ඇ) | පොකුරු සමාගම්වලට අයත් රියදුරු පුහුණු පාසල්වලට අයත් බස්රථ සඳහා | 150.00 |
| (ඈ) | මුල්වරට ලියාපදිංචි කොට මාර්ග බලපත්‍ර ලබා නිත්‍ය මගී ප්‍රවාහනය සඳහා යොදවා ගනු ලබන බස්රථ සඳහා මුල් ලියාපදිංචි දිනයේ සිට | 150.00 |
| (ඉ) | රියදුරු පුහුණු පාසල්වලට අයත් පෞද්ගලික මෝටර් කෝච් සඳහා | 150.00 |
| (ඊ) | පෞද්ගලික මෝටර් කෝච් රථ සහ ඉහත (අ) සිට (ඉ) වර්ගවලට අයත් නොවන මෝටර් කෝච් රථ | 500.00 |

(ඉ) අර්ථ නිරූපනය

1. "මෝටර් සයිකලය" යන්නෙන්, රෝද දෙකක් මත ගමන් කිරීමට සැළසුම් කොට තනා ඇත්තාවූ වාහනයක් අදහස් වේ. එහෙත් එක් අමතර රෝදයක් සහිතව අමුණන ලද පැති කාරයක් ද ඊට තිබිය හැක.
2. "මෝටර් ත්‍රි රෝද රථය" යන්නෙන්, රෝද තුන මත ගමන් කිරීමට සැළසුම් කොට ඇත්තා වූද, සම්පූර්ණ වශයෙන් පුද්ගලයන් ප්‍රවාහනය කිරීම සඳහා තනනු ලැබූ හෝ සකස් කරනු ලැබූ වාහනයක් අදහස් වේ.
3. "මෝටර් ත්‍රි රෝද වෑන් රථය" යන්නෙන්, රෝද තුනක් මත ගමන් කිරීමට සැළසුම් කොට ඇත්තාවූ සම්පූර්ණ වශයෙන් හෝ ප්‍රධාන වශයෙන් භාණ්ඩ ප්‍රවාහනය කිරීමත් සඳහා තනනු ලැබූ වාහනයක් අදහස් වේ.

| | | |
|---|---|---|
| (අ) | මෝටර් සයිකල් සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුව | රු. 700.00 |
| (ආ) | මෝටර් ත්‍රි රෝද රථ සහ මෝටර් ත්‍රි රෝද වෑන් රථ සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුව | රු. 750.00 |

සැ. යු. -

මෙම ගැසට් නිවේදනයට ඇතුළත් කර නොමැති අනෙකුත් ගාස්තු 2011.11.03 වැනි දින අංක 1730/18 දරන IV(අ) වැනි කොටස - පළාත් සභා අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් පරිදි ක්‍රියාත්මක වේ.

05 - 387

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.